මහනුවර අලවතුගොඩ ප්‍රදේශයේ කාන්තාවක් ඝාතනය කිරීමේ සිදුවීම පිළිබඳ විමර්ශන සම්බන්ධයෙන්, දිගින් දිගටම මාධ්‍ය අවධානය යොමු වී තිබිණි. එම ඇතැම් මාධ්‍ය වාර්තාවන් තුළ, එම ඝාතනය වූ කාන්තාවගේ බාහිර ස්වරූපය සම්බන්ධයෙන් වූ අදාළ නොවන සඳහන් කිරීම් පිළිබඳව, මීන් පෙර ද Ethics Eye අපි ඔබේ අවධානය යොමු කර ඇත්තෙමු.
මාර්තු 19, 2023 දින ඉරිදා ලංකාදීප, සති අග අරුණ සහ ඉරිදා මව්බිම පුවත්පත් තුළ ද මෙම ඝාතනයේ විමර්ශන සම්බන්ධයෙන් වාර්තා වී තිබුණි.
එම සෑම පුවත් වාර්තාවකම, අදාළ ඝාතනයට ලක්වූ කාන්තාව "සුරූපී" යැයි, "රූමත්" යැයි දැක්වී තිබිණි.
ඔබ සිතන ලෙසට,
1) මියගිය කාන්තාවගේ බාහිර රූපය මෙම පුවතට කෙතරම් අදාළ වන්නේ ද?
2) මියගිය කාන්තාවගේ බාහිර රූපය පුවතට ආදාළ නොවන්නේ නම්, මෙම පුවත් වාර්තාවන් තුළ එම බාහිර රූපය "සුරූපී", "රූමත්", "රූමතිය" වැනි විශේෂණ ඔස්සේ ඉස්මතු කොට දක්වන්නේ, පුවතට හැඟීම් කළඹවන (භාවාතිශය) සුළු බවක් ලබාදීමට ද?
මේ පිළිබඳව අප මීන් පෙර පළ කළ පුවතට සබැඳිය:
**https://www.facebook.com/ethicseye/photos/1904914726530242?_rdc=1&_rdr**
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!
202

